ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement

**2026.05.28** *චක්‍රලේඛ අංක : 44/ 2026*

**සියලුම දිසා කොමසාරිස්වරුන් වෙත**

***මහත්මයාණෙනි/මහත්මියනි,***

## **<u>ජාතික බාලදක්ෂ පොසොන් කලාපය - 2026</u>**

මිහිඳු මහා රහතන් වහන්සේගේ ශ්‍රී ලංකා ආගමනය සංකේතවත් කරමින් උදා වන පොසොන් උත්සවය නිමිති කොට ජාතික බාලදක්ෂ පොසොන් කලාපයක් පැවැත්වීමට ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය කටයුතු සංවිධානය කරනු ලබන අතර මෙය ජාතික මට්ටමින් කොළඹ දී පැවැත්වීමට සැළසුම් කර ඇත.

මෙම ජාතික බාලදක්ෂ පොසොන් කලාපය 2026 ජුනි මස 28 සහ 29 යන දෙදින සවස 6.00 සිට අලුයම 1.00 දක්වා කොළඹ 02 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ, ලේක් හවුස් වටරවුමේ සිට පොලිස් මුලස්ථාන වටරවුම දක්වා මාර්ගය දෙපස දී පැවැත්වීමට කටයුතු සංවිධානය කරමින් සිටී.

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය විසින් ප්‍රථම වරට සංවිධානය කරනු ලබන මෙම ජාතික පොසොන් කලාපය පොසොන් පහන් කූඩු හා නිර්මාණ ප්‍රදර්ශනය, භක්ති ගීත, පොසොන් තොරණ, දන්සල්, විදුලි අලංකරණය යනාදි සියලු අංගයන්ගෙන් සමන්විත වන අයුරින් සංවිධානය කිරීමට සකස් කර ඇත.

දිස්ත්‍රික් මට්ටමින් එක් එක් දිසාවන් විසින් සංවිධානය කරනු ලබන පොසොන් වැඩසටහන් මාලාවට අමතරව මෙම ජාතික පොසොන් කලාපයට ඔබ සැමට සහභාගී විය හැකි වේ.

### ❖ පොසොන් පහන් කූඩු නිර්මාණය හා ප්‍රදර්ශනය

බාලදක්ෂ දිස්ත්‍රික් මට්ටමින් මේ සඳහා පහන් කූඩු, බොදු බැතිය හා බාලදක්ෂ අනන්‍යතාවය විදහා දැක්වෙන අයුරින් පොසොන් පහන් කූඩු සකස් කර මෙම දෙදින තුළ ප්‍රදර්ශනය කිරිම සඳහා මෙහිදි ඔබට ආරාධනා කර සිටිමු.

මේ සඳහා සහභාගී වීමට අපේක්ෂා කරනු ලබන දිස්ත්‍රික්ක 2026 ජුනි මස 05 වන දිනට පෙර පොසොන් කලාපය භාර ලේකම් කාර්යාලයේ සහය කළමනාකාරිණි පුෂ්පිකා ඉලේපෙරුම මහත්මිය වෙත 0112 433512 දුරකථනයට දැනුම් දීමෙන් ලියාපදිංචි විය හැකි ය.

මෙහිදි ජයග්‍රාහණය කරනු ලබන තරඟකරුවන් හට පහත සඳහන් පරිදි ත්‍යාගයන් පිරි නැමීමට කටයුතු කරනු ලබයි.

- 01 වන ස්ථානය - රු. 100,000/-
- 02 වන ස්ථානය - රු. 75,000/-
- 03 වන ස්ථානය - රු. 50,000/-
- 04 වන ස්ථානයේ සිට 10 වන ස්ථානය තෙක් - රු. 25,000/- බැගින්
- සහභාගී වන සැමට වටිනා සහතිකයක් පිරිනැමේ.

65/9 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත කොළඹ 02. ශ්‍රී ලංකා
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02.
Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka
Tel : + 94 112 433131 /+94 112 433512
FAX : + 94 112 433131
E -mail : slsaheadq@gmail.com
web : www.scout.lk

❖ **පොසොන් භක්ති ගීත ප්‍රසංගය**

පොසොන් බැති ගී හා විස්තර ඉදිරියේ දී ලබා දෙනු ඇත.

මේ සඳහා සහභාගී වන සැමට ද වටිනා සහතිකයක් පිරිනැමේ.

මේ සඳහා ද සහභාගී වීමට අපේක්ෂා කරනු ලබන දිස්ත්‍රික්ක 2026 ජුනි මස 05 වන දිනට පෙර පොසොන් කලාපය භාර ලේකම් කාර්යාලයේ සහය කළමනාකාරිණි පුෂ්පිකා ඉලේපෙරුම මහත්මිය හට 0112 433512 දුරකථනයට දැනුම් දීමෙන් ලියාපදිංචි විය හැකි වේ.

මීට අමතරව වෙනත් නිර්මාණ හෝ අදහස් ඔබ සතුව ඇත්නම් ඒ පිළිබඳ විස්තර ද ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ හැකි ය.

තවද මේ සඳහා ඔබ දිසාවේ දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරයකු/වරියකු පත් කර එය අප වෙත දැනුම් දෙන මෙන් දන්වා සිටිමු. (ඔබ දිසාවේ දැනට මාධ්‍ය හා සංස්කෘතික අංශය සඳහා සහය දිසා කොමසාරිස්වරයකු ඇත්නම් ඒ සඳහා ඔහු පත් කර එම විස්තර අප වෙත ලබා දීමට කටයුතු කරන්න.)

ස්තූතියි,

මෙයට,

බාලදක්ෂ සේවයේ නියුතු,

***ප්‍රභාත් කුලරත්න***
සහය ප්‍රධාන කොමසාරිස්
මාධ්‍ය, මහජන සම්බන්ධතා, ප්‍රවර්ධන හා සංස්කෘතික කටයුතු

***නිතීඥ මනෝජ් නානායක්කාර***
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

පිටපත් - ජාතික බාලදක්ෂ මූලස්ථානයේ සියලුම කොමසාරිස්වරුන්
සභාපති /විධායක කමිටු සභාපති/ගරු ලේකම්/ගරු භාණ්ඩාගාරික - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
කාර්යාලීය ලිපිගොනුවට